# ප්‍රතිකර්මය රෝගයට වඩා භයානකද?

# ශ්‍රී ලංකාවේ කොවිඩ් ආණ්ඩුකරණය පිළිබඳ ආවර්ජනා

සංස්කරණය

ප්‍රදීප් පීරිස්

# දායක වූ ලේඛකයන්

**භවානි ෆොන්සේකා** විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂකවරියක් සහ නීතීඥවරියක් වන අතර, පර්යේෂණ, ජාතික සහ ජාත්‍යන්තර උපදේශනය සහ මහජන නඩුකර පැවරීම ආදී ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ඇය අවධානය යොමු කරනු ලබයි. ඇය දැනට *සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ ජාත්‍යන්තර සඟරාවේ* කර්තෘ මණ්ඩලයේ සමාජිකාවක් වශයෙන් මෙන්ම කොළඹ විශ්වවිද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරියක ලෙස ද කටයුතු කරයි. ඇය වර්ෂ 2016 දී ශ්‍රී ලංකා රජය විසින් පත් කරන ලද උපදේශන කාර්ය සාධක බලකායේ උපදේශකවරියක් වූ අතර වර්ෂ 2017-2021 කාලසීමාව සඳහා ශ්‍රී ලංකාවෙහි ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ කෙටුම්පත් කමිටුවේ සාමාජිකාවක් වූවාය.

**කෞෂිණී දම්මලගේ** සමාජ විද්‍යාඥයින්ගේ සංගමයෙහි සාමාජිකාවක් වේ. ඇයගේ මූලික පර්යේෂණ ලැදියාවන් වන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අධ්‍යයනය, ප්‍රජාතන්ත්‍රවාදය, මැතිවරණ දේශපාලනය සහ ශ්‍රී ලංකාවේ වාම දේශපාලනයේ ඉතිහාසයයි. ඇය වතුකරයේ ශ්‍රම සචලීයකරණයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ක්‍රියාවලීන් පිළිබඳව සහ ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික වමේ පක්ෂයන්හි සංවිධාන උපාය මාර්ග පිළිබඳව ද පර්යේෂණ කටයුතු සිදු කර ඇත.

**හසිනි ලේකම්වසම්** පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා අංශයේ දේශපාලන විද්‍යාව පිළිබඳ කථිකාචාර්යවරියක් සහ සමාජ විද්‍යාඥයින්ගේ සංගමයේ ඉංග්‍රීසි භාෂා සඟරාව වන *Polity* හි සම කර්තෘවරියකි. ඇයගේ පර්යේෂණ ලැදියාවන් අතර අනන්‍යතා ගොඩනැගීමේ දේශපාලන සමාජ විද්‍යාව, අධ්‍යාපනය ප්‍රජාතන්ත්‍රීකරණය සහ අවකාශීය දේශපාලනය සුවිශේෂී වේ.

**නිපුනිකා ඕ. ලේකම්වසම්** භූතානයේ රාජකීය තිම්පු විද්‍යාලයෙහි හි දේශපාලන විද්‍යාව සහ සමාජ විද්‍යා වැඩසටහනට අනුබද්ධ දේශපාලන විද්‍යාව පිළිබඳ කථිකාචාර්යවරියකි. ඇයගේ පර්යේෂණ ලැදියාවන්ගේ පරාසය මානව විද්‍යාව සංවර්ධනය, තාරුණ්‍යය, සාමය සහ ප්‍රජාතන්ත්‍රවාදී පර්යේෂණ ආදී ක්ෂේත්‍ර ආවරණය වන පිරිදි විහිදේ.

**සකිනා මොයිනුඩීන්** විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමීක්ෂණ පර්යේෂණ අංශය වන සෝෂල් ඉන්ඩිකේටර් හි පර්යේෂකවරියක් වන අතර ප්‍රමාණාත්මක සහ ගුණාත්මක පර්යේෂණ ක්‍රම දෙකෙහිම පුළුල් පළපුරුද්දක් ඇත. ප්‍රජාතන්ත්‍රවාදය සහ පාලනය, සාක්ෂරතාවය සහ සංවර්ධනයේ පෝෂණ අංශ, පශ්චාත් යුධ සහ ගැටුම් බලපෑ සමාජවලට විශේෂයෙන් අදාළ වන යුද්ධය සහ සාමය පිළිබඳ මහජන අදහස් සහ අපේක්ෂාවන් සමඟ කටයුතු කිරීමට ඇයගේ පර්යේෂණ අත්දැකීම් ඇයට හේතු වී තිබේ.

**ප්‍රදීප් පීරිස්** කොළඹ විශ්වවිද්‍යාලයේ දේශපාලන විද්‍යා සහ රාජ්‍ය ප්‍රතිපත්ති අංශයහි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු වන අතර විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සමීක්ෂණ අංශය වන සෝෂල් ඉන්ඩිකේටර් හි නිර්මාතෘවරයා ද වේ. ඔහු ශ්‍රී ලංකාවේ ෆෙඩරල් විවාදයේ සිට ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය දක්වා වූ විෂය පරාසයක් පිළිබඳව ප්‍රකාශනයන් ඉදිරිපත් කර ඇත. ඔහු රුචිකත්වයක් දක්වන පර්යේෂණ විෂය ක්ෂේත්‍රයන් අතර ගැටුම් නිරාකරණය, ස්ත්‍රී පුරුෂ සමාජ භාවය, දේශපාලන පක්ෂ, පළාත් පාලනය සහ දකුණු ආසියාවේ ප්‍රජාතන්ත්‍රවාදයේ තත්ත්වය ආදිය සුවිශේෂී වේ.

**කුෂ්මිලා රණසිංහ** විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ පර්යේෂකවරියකි. ඇය කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයෙන් නීතිවේදී උපාධියක් ලබා ඇති අතර ලන්ඩන් විශ්ව විද්‍යාලයෙන් ජාත්‍යන්තර සබඳතා පිළිබඳ විද්‍යාවේදී (ගෞරව) උපාධියක් ද ලබා ඇත.

**ශෂික් සිල්වා** සමීක්ෂණ පර්යේෂකයෙකු, ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂකයෙකු සහ ගුණාත්මක පර්යේෂකයෙකු ලෙස වසර 15 කට වැඩි පළපුරුද්දක් ලබා ඇත. ඔහු මීට පෙර විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි සමීක්ෂණ පර්යේෂණ අංශය වන සෝෂල් ඉන්ඩිකේටර් හි සහ ව්‍යාපෘති සේවා සඳහා වන එක්සත් ජාතීන්ගේ කාර්යාලයෙහි ව්‍යවහාරික පර්යේෂණ ඒකකය සමඟ වැඩ කටයුතු සිදු කර ඇත. ඔහු දැනට ශ්‍රී ලංකා සමාජ විද්‍යාඥයින්ගේ සංගමයේ පර්යේෂකයෙකු සහ පරිපාලන කළමනාකරුවෙකු වශයෙන් කටයුතු කරනු ලබයි. ඔහුගේ ප්‍රධාන පර්යේෂණ ලැදියාවන් වන්නේ ශ්‍රී ලංකාවේ සංහිඳියාව පිළිබඳ බහුවිධ ආඛ්‍යාන අර්ථනිරූපණය කිරීම, යුක්තිය සඳහා පුරවැසියන්ගේ අභිලාෂයන් අවබෝධ කර ගැනීම සහ පළාත් පාලනයට අදාල අන්තර්කරණය සහ බැහැර කිරීම පිළිබඳ ගැටළු ආදී විෂය ක්ෂේත්‍රයන් ය. ඔහු මහජන මත විමසුම් පර්යේෂණ සඳහා වන ලෝක සංගමයේ [World Association for Public Opinion Research (WAPOR)] සාමාජිකයෙකු වන අතර, වර්ෂ 2019 සිට එමඟින් සංවිධානය කරනු ලබන වාර්ෂික සම්මන්ත්‍රණවලදී ඔහුගේ පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කර ඇත.